04/07/2010 - රාවය

**ඇති හිටියා හෙවත් හිටියා ඇති**

ඩෙංගු වසංගතයකි. චිකන්ගුන්යා වසංගතයකි. මොලේ උණ වසංගතයකි. මැලේරියා වසංගතයකි. එහෙත් මෙයටත් වඩා වසංගතයකට අද රට ගොදුරු වී සිටියි. ඩෙංගු නිසා සෑහෙන පිරිසක් මියයති. චිකුන්ගුන්යා නිසා ද මියයති. එහෙත් ඊටත් වඩා ජනතාව විශාල වශයෙන් රෝගී තත්ත්වයට පත් කරමින් මරණය කරා රැගෙන යන වසංගතයට අපේ රට ගොදුරුව ඇත. ඩෙංගු ආදී වසංගත නම් යම් තරමකට මර්දනය කරන්නට හැකි වී ඇත. එහෙත් මේ වසංගතය නම් මර්දනය වන බවක් පෙනෙන්නට නැත. ඒ වෙනුවට දිනෙන් දින හිස ඔසවන බව පෙනේ. ගම් රටවල ජනතාව දිනෙන් දින වැඩි වැඩියෙන් තම ග්‍රහණයට ගොදුරු කර ගන්නා බව පෙනේ. මේ අනෙකක් නොව කසිප්පු වසංගතයයි. මේ රටේ එක්තරා ප්‍රදේශයක පෙරනු ලබන නීතිවිරෝධී කසිප්පු වර්ගයක් එම ප්‍රදේශයේ ජනතාව හඳුන්වනු ලබන්නේ 'ඇති හිටියා ' යනුවෙනි. ඉන් අන්‍යාකාරව අදහස්වන්නේ මෙ කසිප්පු පානය කරන අයට සිදුවන දෙයය. එනම් ජීවත්වුනා ඇති අය පමනක් ඇතිහිටියා හෙවත් හිටියා ඇති පානය කළ යුතු බවය



සැබවින්ම මේ ඇති හිටියා නම් මේ ප්‍රදේශයේ පෙරන නීතිවිරෝධී කසිප්පු වලට පමනක් නොව රට පුරාම පෙරනුලබන නීති විරෝධී කසිප්පු සම්බන්ධයෙන් සාධාරනය . එනම් ජිවත් වීම ඇතිවූ අය පමනක්, සිටියා ඇති අය පමනක් මේවා පානය කලයුතුය. එයට හේතුව අනෙකක්නොව මේ කසිප්පු නිශ්පාදනය සිදුවන ආකාරයයි. අද මේ රටෙ යූරියා පොහොර වලට ඉහළම ඉල්ලුමක්ඇත්තේ වගාවට යෙදීමට පමනක් නොවේ. යූරියා පොහොර අද කසිප්පු නිශ්පාදනයේ ප්‍රධාන අමුද්‍රව්‍යයකි. පොහොර සහනාධාරය යොදවන්නේ වී වගාවට පමනක් නොවේ. කසිප්පු නිශ්පාදනයත් සඳහාය පැලවලට යූරියා සුදුසු වූවත් මිනිසුන්ට සුදුසු නොවන බව අමුතුවෙන් කිවයුතු නැත.

යූරියා පමනක් නොව කසිප්පු නිශ්පාදනයේදී අතට අසුවන සියලු දෙය යොදනුලැබේ. එය මත් බව වැඩි වීමට හේතු වනුයේ නම්, ඕනෑමදෙයක් එක්කරනු ලැබේ. මෙසේ එක්කල දිරූ කටුකම්බි ගෝඩා හැළියට දැමූ සැර නෙවිසේනම් සූර් එක වැඩි වනබව කසිප්පු ජාවාරම්කරුවන් විසින් සොයාගනු ලැබිණි. ඒ අනුව ගෝඩා හැලි වලට හෝ මලකඩ කෑ කටුකම්බි දමනු ලැබිනි. කසිප්පුවලට කටුකම්බි යන නම වැටුනේ එසේය.

මෙලෙස යොදන්නේ කටුකම්බි පමනක් නොවේ. අතට අසුවන ඕනෑම දෙයකි. මෙසේ කසිප්පු පෙරන්නන් විසින් සොයාගෙන ඇති අලුත්ම සොයාගැනිමක් නම් ගෝඩා හැලියට ගොළුබෙල්ලන්

දැමීමයි. සැබවින්ම ඔවුන් යොදෙන්නේ මොනවාදැයි දන්නේ ඒවා පෙරන අයම පමනි. සමහර විට සැර වැඩි වන්නටකියා මැහිතෙල් බිංදුවක් දෙකක් එකතු කරනවා වන්නටද පුලුවන. පොහොරවලට, සැර වැඩි වෙනවානම් මැහිතෙල් වලට ඊටත්වඩා සැර දියයුතුයැයි ඔවුන් සිතනවා වන්නට පුළුවන .

අවුරුද්දකට දෙකකට සැරයක් දිවයිනෙ යම් ප්‍රදේශයකින් කසිප්පු විසවී විස්සක් තිහක් මියයෑම වා්ර්තා වන්නේ මෙසේ කිසිදු සොයා බැලිමකින් තොරව අතට අසුවන සැම දෙයම සැර වැඩි කිරීම සඳහා ගොඩා හැලියට හැලීම නිසායි.



කසිප්පු උවදුර මේ රටේ භයානකම උවදුරය. මේ රටේ මත්පැනට ඇබ්බැහිවූවන්ගේ සංඛ්‍යාවෙන් සියයට 80 කසිප්පු බොන්නන්ය. මේ අය කසිප්පු උවදුරෙන් ගලවා ගැනිම, ජාතික මෙහෙවරකි.


**මිලින්ද මොරගොඩ ජනබලවතනය**

161, කිම්බිරිගස්යාය පාර, කොළඹ 5.
වෙබ් අඩවිය: www.milinda.org
විද්‍යුත් තැපෑල: email@milinda.org